# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2249/49 - 2021 ඔක්තෝබර් මස 15 වැනි සිකුරාදා - 2021.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාණන් විසිනි

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හරිත කෘෂිකර්මාන්තය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. විජිත් වැලිකල මැතිතුමා
   සභාපති, වයිල්ඩ් හොලිඩේස් (පුද්ගලික) සමාගම
2. ලලිත් සෙනෙවිරත්න මැතිතුමා
3. එස්.කේ.බී. කසුන් තාරක අමල් මැතිතුමා
   අධ්‍යක්ෂ, ජෛව ජනන හරිත තාක්ෂණ පර්යේෂණ ආයතනය
4. මාලින්ද සෙනෙවිරත්න මැතිතුමා
   අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
5. ආර්.බී. රසික තුසිත කුමාර මැතිතුමා
   දේශගුණික කෘෂිකාර්මික සම්බන්ධීකාරක/වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්ක
   පරිසර හිතකාමී කෘෂිකාර්මික පුහුණු උපදේශක
6. ආචාර්ය බී.කේ.ජේ. කාවන්තිස්ස මැතිතුමා
   ප්‍රධාන විධායක අධ්‍යක්ෂ
   "සියපත" ජාත්‍යන්තර අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනය (පුද්ගලික) සමාගම
7. සමන්ත ප්‍රනාන්දු මැතිතුමා
   කාන්ගර හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම
8. සමුදිත කුමාරසිංහ මැතිතුමා
   ලංකා බයෝ ෆර්ටිලයිසර්ස් පුද්ගලික සමාගම
9. අජිත් රන්දුනු මැතිතුමා
   ග්‍රීන් ෆෝර්ස් ඇග්‍රිකල්චර් පුද්ගලික සමාගම
10. එන්.එම්. කලීඩ් මැතිතුමා
    ලංකා නේචර් පවර් පුද්ගලික සමාගම
11. ශම්මි කිරින්දේ මැතිතුමා
    බයෝ ෆුඩ්ස් පුද්ගලික සමාගම

1A - G 34915 — 380 (2021/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

12. නිර්මලා කරව්ගොඩ මැතිතුමිය
හයිසොන්ග් ඕඑන්බී පුද්ගලික සමාගම
13. චමින්ද හෙට්ටිකන්කානම්ගේ මැතිතුමා
ආර්.කේ.ජී. බයෝ ග්‍රීන් ෆාර්ම්
14. නිශාන් ද සිල්වා මැතිතුමා
ලෝරන්ස් ලික්විඩ් ෆර්ටිලයිසර්

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් සංවර්ධිත කෘෂි ආර්ථිකයක් ගොඩනැගීම, ඉදිරි දශකය තුළ දේශීය හා ජාත්‍යන්තර පාරිභෝගිකයාට වස විසෙන් තොර කෘෂි නිෂ්පාදන ලබා ගැනීමට අවස්ථාව උදා කිරීම හා පරිසර හිතකාමී වගාවන් හඳුන්වා දීමට කටයුතු කරන බව අවධාරණයට ලක් කර ඇති හෙයින් ද,

පසට හා ජලයට එකතු වන රසායන අපද්‍රව්‍ය අවම කරමින්, ජීවනෝපාය මාර්ග තුළින් පරිසර හිතකාමී සෞඛ්‍යාරක්ෂිත හරිත කෘෂිකර්මයක් බිහි කිරීම රජයේ ප්‍රමුඛ පරමාර්ථයක් වන හෙයින් ද,

නවීන තාක්ෂණ උපක්‍රම භාවිත කරමින්, පරිසර හිතකාමී හා කාබනික වගාවන් සිදුකිරීමෙන් තිරසර හරිත කෘෂිකර්මයක් කරා ගමන් කිරීම තුළින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිලාභ අත්කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ අවධානයට ලක්කරමින් ද,

පර්යේෂණ හා නව නිපැයුම් තුළින් අහිතකර කෘෂි රසායන ද්‍රව්‍ය අවම කිරීමට හා පරිසර හිතකාමී දේශීය පරිසර තත්ත්වයන්ට ගැලපෙන කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය දිරිගැන්වීම් ලබා දීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ද,

1. විජිත් වැලිකල මැතිතුමා
සභාපති, වයිල්ඩ් හොලිඩේස් (පුද්ගලික) සමාගම
2. ලලිත් සෙනෙවිරත්න මැතිතුමා
3. එස්.කේ.බී. කසුන් තාරක අමල් මැතිතුමා
අධ්‍යක්ෂ, ජෛව ජනන හරිත තාක්ෂණ පර්යේෂණ ආයතනය
4. මාලින්ද සෙනෙවිරත්න මැතිතුමා
අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
5. ආර්.බී. රසික තුසිත කුමාර මැතිතුමා
දේශගුණික කෘෂිකාර්මික සම්බන්ධීකාරක/වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්ක
පරිසර හිතකාමී කෘෂිකාර්මික පුහුණු උපදේශක
6. ආචාර්ය බී.කේ.ජේ. කාවන්තිස්ස මැතිතුමා
ප්‍රධාන විධායක අධ්‍යක්ෂ
"සියපත" ජාත්‍යන්තර අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනය (පුද්ගලික) සමාගම
7. සමන්ත ප්‍රනාන්දු මැතිතුමා
කාන්ගර හෝල්ඩිංග්ස් පුද්ගලික සමාගම
8. සමුදිත කුමාරසිංහ මැතිතුමා
ලංකා බයෝ ෆර්ටිලයිසර්ස් පුද්ගලික සමාගම
9. අජිත් රන්දුනු මැතිතුමා
ග්‍රීන් ෆෝර්ස් ඇග්‍රිකල්චර් පුද්ගලික සමාගම
10. එන්.එම්. කලීඩ් මැතිතුමා
ලංකා නේචර් පවර් පුද්ගලික සමාගම
11. ශම්මි කිරින්දේ මැතිතුමා
බයෝ ෆුඩ්ස් පුද්ගලික සමාගම
12. නිර්මලා කරව්ගොඩ මැතිතුමිය
හයිසොන්ග් ඕඑන්බී පුද්ගලික සමාගම
13. චමින්ද හෙට්ටිකන්කානම්ගේ මැතිතුමා
ආර්.කේ.ජී. බයෝ ග්‍රීන් ෆාර්ම්
14. නිශාන් ද සිල්වා මැතිතුමා
ලෝරන්ස් ලික්විඩ් ෆර්ටිලයිසර්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා හරිත කෘෂිකර්මාන්තය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. හරිත කෘෂිකර්මය තිරසාරව පවත්වා ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම
2. විවිධ භෝගයන්ට අවශ්‍ය කාබනික පොහොර හඳුනා ගැනීම හා එම පොහොර නිෂ්පාදනය දියුණු කිරීම
3. කෘමිනාශක හා වල්නාශක නිෂ්පාදන දේශීයව නිෂ්පාදනය කිරීම
4. දේශීය නිෂ්පාදන මගින් අවශ්‍යතා සැපිරීමේ දී ඇතිවිය හැකි හිඟයන් උසස් ප්‍රමිතියෙන් හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනුමැතීන් යටතේ සීමිත ලෙස ආනයනය කිරීමේ ක්‍රමවේදයන් හා අධීක්ෂණ ක්‍රියා හඳුනා ගැනීම
5. කාබනික ආහාර නිෂ්පාදනය හා පරිභෝජනයේ සෞඛ්‍ය, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ජනගත කිරීමේ සංනිවේදන කටයුතු ප්‍රචලිත කිරීම
6. මෙම ක්‍රියාවලිය සඳහා රාජ්‍ය සේවයේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම හා ක්ෂේත්‍ර මට්ටමෙන් කාබනික කෘෂිකර්ම ව්‍යාප්ත සේවා පුළුල් කිරීම

තවද, විජිත් වැලිකල මැතිතුමා, පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සභාපති ලෙස පත් කරමි.

ජනාධිපති අතිරේක ලේකම්, වර්නන් පෙරේරා මැතිතුමා, උක්ත කාර්ය සාධක බලකායේ ලේකම් ලෙස පත් කරමි.

තවද, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකාය සහ දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇතිකිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතු බව උක්ත කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට උක්ත ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, පෙරකී බලකායේ සාමාජිකයින් වන ඔබ අවම වශයෙන් මසකට වරක් මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් නියම කරමි.

තවද, මෙම ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිලිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතු යැයිද, ලබාදිය යුතු සියළුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියළුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියළුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙර කී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියළු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ ඔක්තෝබර් මස 15 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.